සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණය, 2019 ජූලි
## General Certificate of Education (Adv. Level), Grade 13, Third Term Test, July 2019

## ව්‍යාපාර අධ්‍යයනය - Business Studies
## පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 06. | 2 | 11. | 2 | 16. | 2 | 21. | 1 | 26. | 4 |
| 02. | 3 | 07. | 4 | 12. | 5 | 17. | 4 | 22. | 5 | 27. | 1 |
| 03. | 2 | 08. | 2 | 13. | 3 | 18. | 4 | 23. | 2 | 28. | 5 |
| 04. | 2 | 09. | 5 | 14. | 4 | 19. | 5 | 24. | 4 | 29. | 2 |
| 05. | 2 | 10. | 5 | 15. | 4 | 20. | 4 | 25. | 3 | 30. | 2 |

31. (අ) ප්‍රමාණාත්මක බව, ගුණාත්මක බව
සම්පත් ඌණතාවයක් පැවතීම
යල්පනින ලද සම්පත් තිබීම
(ආ) ව්‍යාපාර ආචාරධර්ම සමාජ වගකීම්

32. (අ) පාරිභෝගික පෘත්‍යන්තරය
ISO 27000
(ආ) වරලත්
වරලත් ගිවිසුමත්

33. (අ) (i) මිල කළ සමාගම්
(ii) මිල නොකළ සමාගම්
(iii) සී/ස. පෞද්ගලික සමාගම්
(iv) අක් වෙරළ සමාගම්
(ආ) රිය ශක්ති, හරිත ණය

34. (අ) නිෂ්පාදන වගකීම්
සේව්‍ය වගකීම්
(ආ)



35. (අ) ෆෝක් ලිෆ්ට්
පැලට් පැක්ස්
ෆොක්ලිෆ්ට් ට්‍රක්
භාණ්ඩ එහා මෙහා කිරීමේ පටි
(ආ) බැංකු අණකර, විනිමය බිල්පත, ණයවර ලිපිය, ජාත්‍යන්තර මුදල් ඇණවුම්, විද්‍යුත් ගෙවීම් ක්‍රමය (හරපත, ණයපත)
තැපැල් පැවරුම්
ගුවන් තැපැල් පැවරුම්

36. පාලන අවකාශය/කළමනාකරණ අවකාශය
සංවිධාන ව්‍යුහය
පළල් පාලන අවකාශයක්
පටු පාලන අවකාශයක්

37. (අ) ද්‍රවශීලතාවය
ලාභදායකත්වය
(ආ) S & P ශ්‍රී ලංකා 20
සියලු කොටස් මිල දර්ශකය

38. (අ) මහජන සම්බන්ධතා
(ආ) ඍජු තැපෑල, කැටලොග්, වෙබ් අඩවි

39. (අ) සේවය අවසන් කිරීම
උසස් කිරීම
මාරු කිරීම
තාවකාලිකව
(ආ) වේතන
දිරිදීමනා
අනෙකුත් ප්‍රතිලාභ

40. (අ) සාර්ව, සූක්ෂම
(ආ) දත්ත අත්පත් කර ගැනීම
සැකසීම
ගබඩා කිරීම
බෙදා හැරීම

41. 1. සත්‍ය 2. අසත්‍ය 3. අසත්‍ය
4. අසත්‍ය

42. 1. අවදානම පුරෝකතනය කළ හැකිවීම
2. අවදානම අහඹු ලෙස සිදුවීම
3. සම්බන්ධතාවයකින් තොරවීම
4. සත්‍යාපනය කළ හැකිවීම
5. මූල්‍යමය වශයෙන් තක්සේරු කළ හැකිවීම.

43. 1. හරපත් සන්නම් ලාංඡනය
2. හරපත් අංකය
3. කල් ඉකුත්වන දිනය
4. හරපත් හිමියාගේ නම
5. නිකුත්කළ බැංකුවේ ලාංඡනය

44. මිල සටහන් කිරීම විද්‍යුත් මිල දර්ශක
තීරු සංකේත ක්‍රම Bar code
කිරුම් මිනුම් ක්‍රම විද්‍යුත් තරාදි
ගෙවීම් ක්‍රම ණයපත්/හරපත්
නිරීක්ෂණ ක්‍රම CCTV Camera system

45. 1. නිශ්චිත වීම/සුවිශේෂ වීම
2. මැනිය හැකිවීම
3. ළඟා කරගත හැකිබව
4. යථාර්ථවාදී බව
5. නිශ්චිත කාලයක් දක්වා තිබීම

46. (අ) අවතෝලනයකි.
(ආ) හිමිකාරිත්ව ප්‍රාග්ධනයට වඩා ණය ප්‍රාග්ධනය අඩු නිසා

47. 1. කාලීන වෙළඳපොල අවස්ථා හඳුනාගැනීමට හැකිවීම
2. සීමිත සම්පත් ඵලදායකව යොදා ගැනීමට හැකිවීම.
3. වෙළඳපොළ අවදානම අවමකර ගත හැකිවීම
4. අලෙවි වැඩසටහන් වඩාත් සාර්ථකව කළ හැකිවීම

48. 1. රැකියා දුන්වීම්
2. කුසලතා ඉන්වෙන්ට්‍රි
3. අභ්‍යන්තර ජාලය
4. අභ්‍යන්තර සේවක හඳුන්වාදීම
අනුප්‍රාජතික සැලැස්ම

49. 1. රූපමය දත්ත 2. සංඛ්‍යාමය දත්ත
3. ශ්‍රවණමය දත්ත 4. දෘශ්‍යමය දත්ත

50. 1. වීදුරු ප්‍රතිචක්‍රීකරණය
2. යුරෝපා සංගමයේ රටවල්
3. Google drive
4. ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## II පත්‍රය

01. (අ) හිතකර ලකුණු
(i) සේවා නියුක්තිය වර්ධනය වීම
(ii) දේශීය සම්පත් උපයෝජනය
(iii) ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළයාම
(iv) සමාජ වගකීම් ඉටු කිරීමෙන් සමාජ දායකත්වය වැඩිවීම
(v) දළ දේශීය නිෂ්පාදනය ඉහළ යාම
(1/2 5 4) (ලකුණු 02)

අහිතකර ලක්ෂණ
(i) ඒකාධිකාරී තත්ත්වයක් ඇතිවිය හැකිවීම
(ii) ජනතාවට අත්‍යාවශ්‍ය නමුත් ලාභදායක භාණ්ඩ නිපදවීමට මැලිකමක් දැක්වීම.
(iii) ජනතාවට අනවශ්‍ය පරිභෝජනයට හුරුවීම.
(iv) පරිසර දූෂණය නිසා පාරිසරික ගැටලු වැඩිවීම.
(v) අනවශ්‍ය තරඟය මගින් සම්පත් නාස්තිය සිදුවීම. (ලකුණු 02)
(ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු දෙන්න.)

(ii) (අ) සාම්ප්‍රදායික ව්‍යාපාර කටයුතුවලින් වර්තමාන තරඟකාරී තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීමට හැකියාවක් නැත. එසේම ව්‍යාපාර කටයුතු වලදී අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට නම් විද්‍යුත් ව්‍යාපාර ලෙස ප්‍රතිනිර්මාණය විය යුතුය. පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සීඝ්‍රයෙන් වෙනස්වන බැවින් ඊට සාර්ථක ලෙස ප්‍රතිචාර දැක්වීමට /වෙනස්වන පරිසරයට අනුගත වීම තුළින් ව්‍යාපාර අවස්ථා උදාකර ගැනීමට (ලකුණු 02)

(ආ)
- වේගය වැඩිවීම ගණුදෙනුකරුවන්ට වඩා වේගයෙන් සමීප විය හැකිවීම.
- පහසුබව
- අන්තර්ජාල, වෙබ් අඩවි ඔස්සේ ගනුදෙනු සිදුවීම.
- ගනුදෙනු කරුවන්ගේ ඉල්ලීම්වලට අනුව භාණ්ඩ සැපයීම.
- නිෂ්පාදිතවල වටිනාකම ඉහළ අගයක් ගැනීම. (ලකුණු 02)

(iii) 1. සමාජ සත්කාර ව්‍යාපෘති දියත් කිරීම
2. පරිසර වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
(නම් කිරීමට 1 5 2)
(උදාහරණ සහිතව පැහැදිලි කිරීමට 1 5 2)

(iv) 1. සමාජ වගකීම් ඉටු කිරීමට යාමේ දී ලාභ උපරිම කිරීමේ ඉලක්ක කරා ලඟාවීමට බාධාවීම.
2. අමතර පිරිවැයක් දැරීමට සිදුවීම
3. සමාජ වගකීම් ඉටු නොකරන ව්‍යාපාර සමග තරඟ කිරීමට අපහසු වීම.
4. ව්‍යාපාර අනවශ්‍ය ලෙස ව්‍යාපාර කෙරෙහි බලපෑම් කිරීමට පෙළඹීම.
(කරුණු 4ක් පැහැදිලි කිරීමට ලකුණු 4)

(අ) 1. ව්‍යාපාරය/ව්‍යාපාරයේ ස්වභාවය
2. අයිතිකරුවන්
3. ගණුදෙනුකරුවන්
4. සේවකයන්
5. තරඟකරුවන්
6. සමාජ සංස්කෘතිය
7. ප්‍රායෝගික බව
(6ක් හෝ ඊට වැඩිනම් 02)
(5ක් හෝ 4 වැඩි නම් 01)
(3ක් නම් 1/2)
(2ට අඩුනම් ලකුණු නැත)

(ආ)

| | |
|---|---|
| පාසල් සිසුන් | සාරධර්ම |
| වරලත් ගණකාධිකාරීවරුන් | චාටර් පත්‍රය |
| රාජ්‍ය සේවකයන් | ආයතන සංග්‍රහ |
| වෛද්‍යවරුන් | හිපොක්‍රටීස් දිවුරුම |

(ලකුණු 02)

02. (i) (අ) 1. පූර්ණ සේවා නියුක්තිය ඇති කිරීම
2. මිල ස්ථායීතාවය ඇති කිරීම
3. ආර්ථික වර්ධනය වේගවත් කිරීම
4. තිරසර සංවර්ධනය ඇති කිරීම
5. සාධාරණ ආදායම් බෙදීයාමක් ඇති කිරීම.
(1/2 5 4)

(ආ) 1. ගණුදෙනුකරුවෙකු ලෙස භාණ්ඩ හා සේවා මිලදී ගනිමින් ව්‍යාපාරවලට බලපෑම් කිරීම.
2. විවිධ සේවා සැපයීම තුළින් තරඟකරුවකු ලෙස කටයුතු කිරීම.
3. යටිතල පහසුකම් හා අත්‍යවශ්‍ය සේවා සපයමින්
4. නියාමකයකු ලෙස ක්‍රියාත්මක වීමෙන්
5. බදු හා ණය ආදී දිරිගැන්වීම් සපයන්නකු ලෙස කටයුතු කිරීමෙන් (1/2 5 4)

(ii) (අ) 1. මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ අයිතිය
2. වන්දි ලබා ගැනීමට ඇති අයිතිය
3. පාරිභෝගික අධ්‍යාපනය ලබා ගැනීමට ඇති අයිතිය
4. සුවදායක පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය (1/2 5 4)

(ආ) 1. ස්වයං ආරක්ෂාව
2. පාරිභෝගික සංවිධාන මගින්

සංවිධානාත්මක ආරක්ෂාව
3. රජයේ අණපනත් මගින් සිදු කරන ආරක්ෂාව (1 5 2)

(iii) හැකිය (ලකුණු 1)
සමාගම් පනත අනුව සමාගමක අධ්‍යක්ෂවරයකු වීම සඳහා සමාගමෙන් කොටස් මිලදී ගැනීම අනිවාර්ය නොවේ. සමාගමේ සාමාජිකයෙකු නොවන පාර්ශවයකට වුවද අධ්‍යක්ෂක වරයකු ලෙස ඉදිරිපත් විය හැකිය. ඒ අනුව අවම සාමාජික සංඛ්‍යාව හා අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව අතර සබඳතාවයක් නොමැත. (ලකුණු 3)

(iv) (අ) 1. ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය
2. ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය
3. සාමාජික ආර්ථික සහයෝගීතාවය
4. ස්වෛරීභාවය හා නිදහස
5. සමුපකාර අධ්‍යාපනය, පුහුණුව හා තොරතුරු ලබා දීම.
6. ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර සහයෝගීතාවය
7. සමාජය පිළිබඳ සැලකිලිමත් වීම
කරුණු 6ට ලකුණු 02
5ට 01
4 හෝ 3 නම් 1/2

(ආ) 1. තරඟකාරී මුහුණුවරක් නොගැනීම
2. මූල්‍ය සම්පාදනය සීමිත වීම
3. සමුපකාර ප්‍රතිපත්ති මතම පිහිටා කටයුතු කිරීම
4. සීමිත කාලයක් විවෘතව තැබීම
5. ණය පදනම මත භාණ්ඩ අලෙවි නොකිරීම
6. කළමනාකරණ අකාර්යක්ෂමතාව (1/2 5 4)

(v) 1. තිරස් සංයෝජනය එක සමාන ව්‍යාපාර 2ක් හෝ කිහිපයක් ඒකාබද්ධ වීම
2. සිරස් සංයෝජනය කිසියම් නිෂ්පාදනයක යෙදෙන ව්‍යාපාර දාමයේ විවිධ අවස්ථාවල යෙදී සිටින සමාගම් කිහිපයක් ඒකාබද්ධවීම.
3. විෂම සංයෝජනය වෙනස් වූ ව්‍යාපාර ක්ෂේත්‍ර 2ක නියැලි සමාගම් කිහිපයක් ඒකාබද්ධවීම
(උදාහරණ සහිත පැහැදිලි කිරීමට ලකුණු 4යි)

03. (i) 1. වටිනාකමේ මිනුම් දණ්ඩක්, විනිමය මාධ්‍යයක්
2. විනිමය මාධ්‍යයක්, වටිනාකමේ සන්නිධියක්
3. විලම්බිත ගෙවුම් මාධ්‍යයක්
4. වටිනාකමේ සන්නිධියක් (1 5 4 ලකුණු 04)

(ii) (අ) විවට වෙළඳපොළ කටයුතු
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භයේ මූල්‍ය පාලන උපකරණයක් ලෙස විවෘත වෙළඳ පොළේ භාණ්ඩාගාර බිල්පත් විකිණීම හා ප්‍රතිමිලට ගැනීමේ ක්‍රියාවයි.
ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය
රටතුළ පවත්නා වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙන යා යුතු තැන්පතු සංචිතයයි.
(1 5 2 ලකුණු 02)

(ආ) 1. ක්ෂණිකව අරමුදල් හුවමාරුව
2. මහ බැංකුව සමග චෙක්පත් මගින් ගනුදෙනු කිරීම නැවතීම නිසා පෙර සිදු වූ අපහසුතා මග හැරීම.
3. ගනුදෙනු සඳහා කාල පමාවක් නොමැති හෙයින් ද්‍රවශීලතා කළමනාකරණයේ ප්‍රගතියක් ඇති වීම.
4. පිරිවැටුම හා ගනුදෙනුවල ප්‍රමාණය විශාල වීමෙන් වාසි ඇතිවීම.
5. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පොලී රහිතව සපයනු ලබන දවස තුළ ද්‍රවශීලතා පහසුකම ලබාගත හැකිවීම. (1 5 2 = ලකුණු 02)

(iii) (අ) 1. ඉහළ පොලියක් ගෙවීම
2. අයදුම්පත් පිරවීම වැනි ලිපි ලේඛන කටයුතු ඉටු කරදීම
3. මුදල් නිවසට පැමිණ රැගෙන යාම හා පොලී නිවසටම ගෙනැවිත් භාරදීම.
4. කාර්යක්ෂම සේවය (ලකුණු 02)

(ආ) 1. ලියාපදිංචි මූල්‍ය ආයතනයක් ද යන්න.
2. තැන්පතු භාර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගෙන තිබේ ද යන්න.
3. ලැබෙන ප්‍රතිලාභය
4. ලබාගෙන ඇති ණය ශ්‍රේණිය
5. ආයතනයේ ඉතිහාසය (1/2 5 4 = 02)

(iv) (අ) 1. රක්ෂණ කටයුතු වල නියුතු රක්ෂණ සමාගම් විවිධ ආයෝජන කටයුතුවල යෙදීම.
2. විවිධ රක්ෂණ ක්‍රම හඳුන්වා දීම නිසා ව්‍යාපාරික කටයුතු පුළුල් වීම මගින් ජාතික නිෂ්පාදනය වැඩිවීම හා ආර්ථික වර්ධනය
3. රක්ෂණ කටයුතු නිසා රටේ රැකී රක්ෂා විශාල ප්‍රමාණයක් පතිත වීම.
මූල්‍ය වෙළඳ පොළ දියුණු වීම.
(1/2 5 4 = 02)

(ආ) 1. නම, ගම, වයස, ලිපිනය වැනි පුද්ගලයා පිළිබඳ සියළු තොරතුරු
2. සෞඛ්‍ය තත්ත්වය
3. ආදායම් තත්ත්වය
4. වත්කම් තත්ත්වය
5. යැපෙන්නන් සංඛ්‍යාව
(1/2 5 4 = 02)

(v) මුහුදු මාර්ග ප්‍රවාහනයේ දී නැවට, හා නැව් බඩු වලට සිදුවිය හැකි හානි ආවරණය කරන රක්ෂණය මුහුදු උවදුරු රක්ෂණය වේ. (ල. 01)
ලබාගත හැකි රක්ෂණ වර්ග දෙක
නැව් කඳ නැවට වන හානි
නැව් බඩු ගෙනයන භාණ්ඩ වලට හානි
(1/2 5 2 = 01)
නැව් කඳ රක්ෂණය යටතේ
සියළු අවදානම් ඔප්පුව, අලුත් වැඩියා ඔප්පුව, තොටුපල ඔප්පුව, ඇගයූ ඔප්පුව,
නැව් බඩු රක්ෂණය, අනාගත ආවරණ ඔප්පුව, විවෘත ඔප්පුව. ඔප්පු වර්ග 2 බැගින් කෙටියෙන් හඳුන්වා තිබිය යුතුය. (1/2 5 4 = 02)

05. (i) 1. අන්තර්ජාලය
පුළුල් පරාසයක් ආවරණය කරමින් සකස් කරනු ලබන පරිගණක ජාලයක් අන්තර් ජාලය ලෙස හඳුන්වයි. යම් පාර්ශවයකට අන්තර්ජාල පහසුකම ලබා ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා පරිගණකයක් මෝඩම උපකරණයක් හා සාමාන්‍ය දුරකථනයක් ආධාර කරගත යුතුය.
2. දත්ත සම්මන්ත්‍රණ
භාවිත කරන්නන් දෙදෙනකු හෝ ඊට වැඩි පිරිසක් සඳහා එකම වේලාවක දත්ත ගොනු සංස්කරණය කිරීම හෝ නවීකරණය කිරීම සඳහා විද්‍යුත් මාධ්‍යයන් හරහා සාකච්ඡා කිරීමේ පහසුකම මෙයින් අදහස් වේ.
3. බහු මාධ්‍ය

මාධ්‍ය දෙකක් හෝ වැඩි ගණනක් පරිගණකය භාවිතයෙන් ඒකාබද්ධ කිරීමේ පහසුකම සලසන තාක්ෂණය බහු මාධ්‍ය වේ. මේ සඳහා ලේඛණ ග්‍රැෆික්ස්, කඩ, ශබ්ද, චලන, සජීවී කරණ රූපයක විවිධ මාධ්‍ය යොදා ගනී.

4. ටෙලෙක්ස් ක්‍රමය අභිබවා ලෝකය පුරා ප්‍රසිද්ධව ඇත. මෙමගින් ලියවිලි, සිතියම් මෝස්තර සැකසුම් ආදිය ඉතා කෙටි කලකින් තම ෆැක්ස් යන්ත්‍රයට ඇතුළත් කොට පණිවිඩය ලබන්නා සතු යන්ත්‍රයෙන් ඡායා පිටපත් කොට ලබාගත හැකිය. මෙමගින් පණිවුඩයේ නිවැරදි භාවය තහවුරු වීමයි.

(1 5 4 = 04යි)

(ii) (අ) 1. බම්බලපිටියේ සිට කොළඹ දක්වා මාර්ගය තනි මාර්ගයක් බවට පත් කිරීම.
2. නගරයට එන වාහන ප්‍රමාණය අඩු කිරීම.
3. රථ වාහන සංඥා නීති ඇති කිරීම.
4. ප්‍රවාහන මාධ්‍යවල සංවර්ධනය
5. දිවා කාලයේ දී බර වාහන ධාවනය අඩු කිරීම.
6. වාහන වල දුම් පරීක්ෂාව තුළින් නුසුදුසු තත්ත්වයේ වාහන ඉවත් කිරීම.
7. අනාගතයේ දී සැහැල්ලු දුම්රිය ප්‍රවාහන සේවාවක් ආරම්භ කිරීමට කටයුතු කිරීම.
8. පිටත වටරවුම් අධිවේගී මාර්ගය
9. ගුවන් පාලම් කිහිපයක් ඇති කිරීම.
10. කොට්ටාව බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඇති කිරීම.

(1/2 5 4 = 02යි)

(ආ) 1. ධාවන වේග සීමා පනවා ඇති බව
2. ගෙන යා හැකි මගීන් සංඛ්‍යාව තීරණය කර ඇති බව
3. අදාළ අවස්ථාවල මාර්ග ධාවන බලපත්‍ර ලබාගත යුතු බව.
4. මගීන්ට ටිකට් පත් නිකුත් කළ යුතු බව.
5. මගීන්ට ආරක්ෂාව ලැබෙන ලෙස යෝග්‍ය ආකාරයෙන් වාහන වාහන නඩත්තු කර පවත්වාගෙන යා යුතු බව (1/2 5 4 = 02යි)

(iii) (අ) ව්‍යාපාර ආයතනයකට තොගයක් මිල දී ගත් අවස්ථාවේ හෝ නිෂ්පාදනයෙන් පසුව හෝ ඒවා අලෙවි කිරීම දක්වා හෝ නැවත භාවිතයට ගන්නා තෙක් හෝ බෙදා හරින තෙක් රැස්කර තබා ගැනීම හෝ කල්තබා ගැනීමේ ක්‍රියාවලිය ගබඩාකරණය ලෙස හඳුන්වයි.

(ල. 01)

**කාර්යයන්**

තොග ලැබීම.
තොග පරීක්ෂා කිරීම
තහවුරු කර ගැනීම
තොග රඳවා ගැනීම හෝ හරවා යැවීම
ගබඩා කිරීම
ඇණවුම් ලබා ගැනීම හෝ ඇණවුම් තෝරා ගැනීම
තොග නිකුත් කිරීම.

(අනුපිළිවෙළින් කරුණු 6ක්වත් ඇත්නම් ලකුණු 02යි)

(ආ) 1. අඛණ්ඩව පාරිභෝගික වුවමනා ඉටු කිරීමේ හැකියාව.
2. කාර්ය සැලසුම් සහගතව ඉටුවීම තුළින් නාස්තිය අපතය අවම වීමෙන් පිරිවැය අඩුවීම.
3. තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දිය හැකිවීම.
4. අපද්‍රව්‍ය කළමනාකරණය පහසුවීම.
5. ව්‍යාපාර ආයතනය පුළුල් වීමේ දී ඇතිවිය හැකි සංකීර්ණතා අවම වීම
6. කර්මාන්තය තුළ නායකයා වීමෙන් අත්පත් කරගත හැකි ප්‍රයෝජන

(1/2 5 4 = ල. 02)

(iv) (අ) වාසි:
1. තම භාණ්ඩ බෙදා හැරීම පහසුවීම
2. තම භාණ්ඩ හඳුන්වා දීම පහසුවීම.
3. මුළු කාලයම නිෂ්පාදනයට යොදාගත හැකිවීම.
4. වෙළඳ පොළ තොරතුරු පහසුවෙන් ලබාගත හැකිවීම.
5. වෙළඳ පොළ ප්‍රසාරණය වීම

(1/2 5 2 = ල. 01)

අවාසි:
1. අනවශ්‍ය භාණ්ඩ හිඟයක් ඇතිවීම.
2. භාණ්ඩ මිල ඉහළ යාම නිසා ඉල්ලුම අඩුවීම
3. නිෂ්පාදකයාට වෙළඳ පොළ පාලනයට ඇති බලය හීනවීම.
4. තම භාණ්ඩ බාලකරමින් විෂමාචාර සිදු කිරීමට ඉඩකඩ තිබීම.
5. වැරදි තොරතුරු සැපයීම නිසා ඇතිවිය හැකි හානි (1/2 5 2 = ල. 01)

(ආ) 1. ආනයන කරුවෙකු ලෙස ලියා පදිංචියට
2. විදේශ ගැණුම් කරුවන් සොයා ගැනීම.
3. අවශ්‍ය නම් අපනයන බලපත්‍ර ලබා ගැනීම.
4. ආනයන කරුගේ මිල විමසුමට ප්‍රතිචාර වශයෙන් මිල කියුමක් ලැබීම.
5. ආනයන කරුගෙන් ඉන්ඩෙන්ටුව ලබාගැනීම.
6. භාණ්ඩ තොගය නැව්ගත කිරීමට අවශ්‍ය ලියවිලි සකස් කිරීම හා ඉඩ වෙන් කරවා ගැනීම.
7. නැව්ගත කිරීමට සුදුසු වන ආකාරයට භාණ්ඩ ඇසුරුම් කිරීම.
8. අපනයන තොගය රක්ෂණය කිරීම.
9. භාණ්ඩ නැව්ගත කර නෞභාර පත ලබා ගැනීම.
10. මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම.

(අනුපිළිවෙළට කරුණු 6ක් වත් ඇත්නම් ලකුණු 02)

(v) 1. ලෝක වෙළඳ සංවිධානය 12 ගුරු අත්පොත 233 පිටුව
2. ආසියානු සංවර්ධන බැංකුව 12 ගුරු අත්පොත 233 පිටුව
3. උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම 12 ගුරු අත්පොත 231 පිටුව
4. යුරෝපීය සංගමය 230 පිටුව

(1 5 4 = ලකුණු 04)

05. (i) (අ) එකඟ වේ. (1/2)
කළමනාකරණය තුළින් අපේක්ෂිත කාර්යක්ෂමතාව හා සපලදායිත්වය පිළිබිඹු වන පිළිතුරට (ලකුණු 1 1/2)

(ආ) **කළමනාකරු**
1. අන් අය ලවා කාර්ය ඉටු කර ගනී
2. අයිතිකරුට වගකීමෙන් බැඳේ.
3. ඍජු අධීක්ෂණයක නැත.

**කළ. නොවන සේවකයා** (ලකුණු 1/2x1=1)
1. තමාට පැවරී ඇති කාර්යයන් තමාම ඉටු කරයි.
2. කළමනාකරුවන්ට වගකීමෙන් බැඳේ.
3. ඍජුව අධීක්ෂණයට බඳුන් වේ.

(ලකුණු 01)

(ii) (අ) බලතල පැවරීමට ඇති අකමැත්ත
බලතල තමා සතුකර ගැනීමට ඇති අධික කැමැත්ත
නියෝජ්‍ය විදුහල්පති පිළිබඳ ඇති සැකය /අවිශ්වාසය
නි. විදුහල්පතිට අදාළ කටයුතු කළ නොහැක යන ආකල්පය
තම දුර්වලතා හෙළිවේය යන බිය
අංශ ප්‍රධානී ගුරු මහත්මිය පිළිබඳ ඇති විශ්වාසය (1/2 බැගින් ලකුණු 4)

(ආ) බලතල යනු තනතුරු මත ලැබෙන දෙයකි. විදුහල්පතිවරයාට සිය තනතුර මත ඊට අදාළ බලතල හිමි වී ඇත. නියෝජ්‍ය විදුහල්පති වරයාට තනතුර මත එතරම් බලතල හිමි නොවුව ද ඔහු තුළ ආකර්ශනීය බව, පරිත්‍යාගීලී බව, විශේෂඥතාව, පෞරුෂත්වය වැනි හේතු මත බලය හිමි වී ඇත. ඒ අනුව බලතල යනු බලය ලැබෙන එක් ක්‍රමයක් පමණි.

(iii) (අ) පුහුණු සේවකයන් යොදා ගැනීම හෝ සේවකයින්ට මනා පුහුණුවක් ලබා දීම.
ගුණාත්මක අමුද්‍රව්‍ය භාවිතය
සම්පත් නාස්තිය අවම කිරීම
නව තාක්ෂණය යොදා ගැනීම තුළින් පිරිවැය අඩු කර ගැනීම
කල්පවතින ලෙස නිෂ්පාදන සැලසුම් කිරීම

(iv) (අ) **ස්ථාවර පිරිවැය**
ගොඩනැගිලි ක්ෂය
ගෙවල් කුලී
ස්ථිර සේවක වැටුප්
රක්ෂණ ගාස්තු (1/2 5 2)
**විචල්‍ය පිරිවැය**
විදුලිබිල
ප්‍රචාරන වියදම්
නඩත්තු වියදම්
කුලී වැටුප් (1/2 5 2)

(ආ)

| | නිර්නායක | කාර්ය නිෂ්පාදනය | භාණ්ඩ නිෂ්පාදනය | ප්‍රවාහ නිෂ්පාදනය |
|---|---|---|---|---|
| (අ) | වරකදී නිපදවන ප්‍රමාණය | ඉතා අඩුය | මධ්‍යම | ඉතා විශාල (1/2) ප්‍රමාණය (1/2) |
| (ආ) | නිෂ්පාදිත පරාසය | විවිධ | කිහිපයක් පමණි | එකක් පමණි (1/2) |
| (ඇ) | නිෂ්. ක්‍රියාවලියේ නම්‍යශීලී බව | ඉතා ඉහළය | සාමාන්‍ය | ඉතා අඩුය (1/2) |
| (ඈ) | ඇනවුමටද /තොග වශයෙන් | ඇනවුමට | ඇනවුමට/ කුඩා තොග වශයෙන් | තොග වශයෙන් |

(v) (අ) කාර්යක්ෂම හා සඵලදායී ලෙස මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය කාර්ය මධ්‍යස්ථාන ද්‍රව්‍ය, උපකරණ හා ඊට සහාය දෙපාර්තමේන්තු මනා ලෙස පිළියෙල කර ගැනීම කම්හල් පිරියත ලෙස හැඳින්වේ. (ලකුණු 2)

(ආ) නිෂ්පාදන ක්‍රමය
නිෂ්පාදිතයේ ස්වභාවය
භූමියේ ඇති ඉඩකඩ
පවත්නා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ
භාවිතා කරන තාක්ෂණය
නීතිමය අවශ්‍යතා (1/2 5 4)

06. (i) (අ) වටිනාකම හා තෘප්තිය (ලකුණු 01)
වටිනාකම යනු පාරිභෝගිකයාට අවශ්‍යතා ඉටුකර ගැනීමට තිබෙන හැකියාව පිළිබඳ ඔහු සිදු කරනු ලබන තක්සේරුවයි. තෘප්තිය යනු සිය අවශ්‍යතා හා වුවමනා අපේක්ෂිත ලෙස ඉටු කර ගැනීමට හැකිවීම තුළින් ලබන සතුටයි. (ලකුණු 1)

(ආ) * පාරිභෝගිකයා තුළ සුභවාදී ආකල්ප ගොඩ නැගිය හැකිවීම.
* පාරිභෝගික පක්ෂපාතීත්වය, වර්ධනය වීම
* දිගු කාලයක් වෙළෙඳපොල තුළ රැඳී සිටිය හැකි වීම.
* ව්‍යාපාරික කීර්තිනාමය වර්ධනය වීම
* තරඟයට සාර්ථක ලෙස මුහුණ දිය හැකිවීම. (1/2 5 4)

(ii) (අ) නිෂ්පාදිතය පිළිබඳ සියලු තොරතුරු ඇසුරුම තුළ අඩංගු වන බැවින් (නිෂ්පාදකයා, රට මිල කල් ඉකුත්වන හා නිෂ්පාදිත දිනය, පාවිච්චි කරන ආකාරය, ප්‍රමිති සහතිකය ආදිය) (ලකුණු 2)

(ආ) **අභ්‍යන්තර සාධක**
භාණ්ඩයේ පිරිවැය
අපේක්ෂිත ලාභය
අපේක්ෂිත පරමාර්ථ (1/2 5 2)
**බාහිර සාධක**
තරඟකාරී භාණ්ඩවල මිල
වෙළඳ පොල ඉල්ලුම
රජයේ නීති රීති (1/2 5 2)

(iii) (අ) එකඟ නොවේ. (1/2)
අලෙවිකරණයේ දී සිදු වන්නේ විකිණීමට පෙර හා පසු සිදුකරන කටයුතු කිහිපයකි. පාරිභෝගිකයාගෙන් ආරම්භ වී පාරිභෝගිකයාගෙන් අවසන් වන පුළුල් පරාසයක් දක්වා විහිදෙන ක්‍රියාවලියකි. එහිදී විකිනීමට අමතරව මිල කිරීම, ඇසුරුම්කරණය, සන්නම්කරණය, ප්‍රවර්ධනය, අලෙවි පර්යේෂණ වැනි පුළුල් කාර්යයන් රැසක් ඉටු කරනු ලබයි. ඒ අනුව විකිනීම අලෙවිකරණය නම් පුළුල් ක්‍රියාවලියට අයත් එක් කාර්යයක් පමණි.
(ගැළපෙන පිළිතුරට ලකුණු 1 1/2)

(ආ) 1. නිෂ්පාදිතයට ආරක්ෂාව ලැබීම.
2. නිෂ්පාදිතය හඳුනා ගැනීම පහසු වීම
3. නිෂ්පාදිතය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ හැකිවීම.
4. ප්‍රවාහනය හා ගබඩාකරණය පහසුවීම
5. ප්‍රවර්ධන උපකරණයක් ලෙස භාවිතා කළ හැකිවීම. (ලකුණු 02)

(iv) පෞද්ගලික අලෙවිය (1)
කෘෂි කර්මාන්තයේ දී භාවිතා කරන යන්ත්‍රයක් නිසා එය කාර්මික භාණ්ඩ ගණයට අයත් වේ. එබැවින් ඉලක්ක කරන පාරිභෝගිකයන් එනම් කෘෂිකර්මාන්තයේ යෙදී සිටින පිරිස් වෙත ගොස් අදාල යන්ත්‍රය ක්‍රියාත්මක කර පෙන්වා එහි ඇති ප්‍රතිලාභ හා සුවිශේෂතා පහදා දීම මගින් එය මිලදී ගැනීමට උනන්දුවක් ඇති කර ඇණවුම් වැඩි කර ගැනීමට පෞද්ගලික අලෙවිය නම් ප්‍රවර්ධන ක්‍රමය මගින් අවස්ථාව උදා වේ.
(ල. 03)

(v) (අ) භාණ්ඩාගාර බිල්පත්
භාණ්ඩාගාර බැඳුම්කර
සාමාන්‍ය කොටස්
වරණීය කොටස්
වාණිජ පත්‍රිකා
තැන්පතු සහතික
සංගමික ණයකර (1/2 5 4)

(ආ) 1. පුද්ගලයන් හා ආයතන ආයෝජන සඳහා දිරිගැන්වීම
2. සමාගම්වලට විශාල ප්‍රාග්ධනයක් රැස්කරගත හැකිවීම
3. සමාගම්වල කීර්තිනාමය හා ප්‍රතිරූපය

ඉහළයාම
4. රජයේ සුරැකුම්පත් අලෙවියෙන් රජයට අවශ්‍ය අරමුදල් රැස්කරගත හැකිවීම.
5. විදේශ ආයෝජන රට තුළට ගලා ඒම.
6. සමාගම්වල කොටස් සඳහා ද්විතීයික වෙළඳ පොලක් බිහිවීම. (1/2 5 4)

07. (i) 1. ලාභාංශ හිමිවීම
2. ප්‍රාග්ධන ලාභ ලබාගත හැකි වීම
3. හිමිකම් නිකුතුවකදී ඊට අවස්ථාව ලැබීම
4. සංචිත ප්‍රාග්ධන කරණයකදී කොටස් ප්‍රමාණය වැඩි කර ගත හැකිවීම.
(4ක් නම් කිරීමට ලකුණු 2)
(2ක් පැහැදිලි කිරීමට ලකුණු 2)

(ii) (අ) 1. ආයෝජනයේ ප්‍රතිලාභ
2. ආයෝජනයේ අවධානම
3. ද්‍රවශීලතාවය
4. පරිසර සාධක
5. ආයතනයේ ප්‍රතිපත්ති
6. ආයෝජනයේ පිරිවැය
7. පරිසර සාධක (1/2 5 4)

(ආ) **කෙටි කාලීන ආයෝජන තීරණ**
1. මුදල් සම්බන්ධ තීරණ
2. වෙළඳ ණයගැතියන් සම්බන්ධ තීරණ
3. වෙළඳ තොගය සම්බන්ධ තීරණ
4. සුරැකුම්පත් සම්බන්ධ තීරණ
(1/2 5 4)

**දිගු කාලීන ආයෝජන**
1. ව්‍යාපාර ස්ථානගත කිරීම සම්බන්ධ තීරණ
2. නවීකරණ හා පුළුල් කිරීම සම්බන්ධ තීරණ
3. ව්‍යාපාර විවිධාංගිකරණය සම්බන්ධ තීරණ
4. දිගුකාලීන වත්කම් සම්බන්ධ තීරණ
(1/2 5 4)

(iii) 13 ශ්‍රේණියේ ගුරු අත්පොත 195, 196, පිටු අංක

(iv) (අ) * සජීව සම්පතක් වීම
* සිතීමට හා ප්‍රතික්‍රියා දැක්වීමට හැකිවීම
* සෙසු සම්පත් පාලනය කළ හැකිවීම
* පුහුණු කිරීමෙන් අගය වැඩිවීම
* කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීම
* චර්යා සංකීර්ණ වීම
* නිර්මාණාත්මක හැකියා සහිත වීම.
(ලකුණු 02)

(ආ) අයදුම්පත් ඇගයීම, සම්මුඛ පරීක්ෂණ බුද්ධි පරීක්ෂණ, පෞරුෂ පරීක්ෂණ, ප්‍රායෝගික පරීක්ෂණ, වෛද්‍ය පරීක්ෂණ, පසුබිම් පරීක්ෂණ, (ලකුණු 02)

(v) (අ) * රැකියාව ආශ්‍රිත හේතු
* සේවා තත්ත්වයන් ආශ්‍රිත හේතු
* මානව සම්පත් කළමණාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, උපාය මාර්ග වලට අදාළ හේතු
* නුසුදුසු පුද්ගල චර්යාවන් සම්බන්ධිත හේතු
* සංවිධාන නීතිරීති උල්ලංඝනය කිරීමට අදාළ හේතු (ලකුණු 02)

(ආ) සේවක ඵලදායීතාවය ඉහළ යාම
සම්පත් නාස්තිය අඩුවීම
සේවක ප්‍රවාසිතාව අඩුවීම
සේවක පිරිවැටුම අඩුවීම
කාර්මික ආරවුල් අඩුවීම
අභිප්‍රේරණය වූ සේවක කණ්ඩායමක් බිහිවීම
(ලකුණු 02)

08. (i) (අ) 1. ඇස්තමේන්තු ගත ව්‍යාපෘති පිරිවැය
2. ඇස්තමේන්තු ගත ආදායම් ප්‍රකාශය
3. ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය
4. ඇස්තමේන්තු ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
5. ණය ආපසු ගෙවීමේ සටහන

(ආ) * අදාළ පාර්ශවයන්ට නිවැරදිව තොරතුරු සන්නිවේදනය කිරීම
* නිෂ්පාදිත ගුණත්වය ඉහළ නංවාලීමට සහායවීම.
* ආයතනයේ පිරිවැය අවම කිරීම සඳහා සහායවීම.
* තරඟයට සාර්ථකව මුහුණ දිය හැකි වීම.
* විවිධ පාර්ශවයන්ට තොරතුරු ලබා දිය හැකි වීම. (1/2 5 4)

(ii) (අ) * මුදල් කළමනාකරණය
* ප්‍රාග්ධන අයවැයකරණය
* මූල්‍ය සැලසුම්කරණය
* මූල්‍ය පුරෝකථනය හා විගනනය
(1/2 5 4)

(ආ) 1. වේගවත් බව
2. නිරවද්‍ය බව
3. විශ්වාසවන්ත බව
4. ගුණාත්මක බව
} නම් කර පැහැදිලි කිරීමට (ලකුණු 02)

(iii) මෙම තොරතුරු පද්ධතිය විධායක තොරතුරු පද්ධතිය ශක්තිමත් කරයි. මෙම පද්ධතිය නිර්මාණය කරනුයේ තීරණ උපකාරක පද්ධති සඳහා භාවිතා කරන දත්ත හා තොරතුරු භාවිතයෙනි. මෙය හැකියා, ක්‍රියාවලින් තාක්ෂණයේ භාවිතයෙන් හා පරිචයන්ගෙන් සමන්විත වූ පද්ධතියකි. (ලකුණු 4)

(iv) (අ) 1. අරමුදල් ලබා ගැනීමේ දී මූල්‍ය ආයතනවලට ඉදිරිපත් කළ හැකිවීම.
2. ඇල්මැති පාර්ශවයන් සියලු දෙනාට අවශ්‍ය තොරතුරු ලබා දිය හැකිවීම.
3. ආයතනය පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ගොඩනගා ගත හැකිවීම.
4. කාර්ය සාධනය මැන බැලීමට පහසු වීම.
(1/2 5 4)

(ආ) 1. ව්‍යවසායකයන්/හවුල්කරුවන් පිළිබඳ
2. කළමනාකරණ කුසලතා
3. සංවිධාන ව්‍යුහයේ මූලික තනතුරු හා වගකීම්
4. සංවිධාන සටහන
5. වාර්ෂික වියදම (1/2 5 4)

(v) ව්‍යාපාර සැලැස්මේ මුල් පිටුවෙන් ඉදිරිපත් කරනු ලබන්නේ ව්‍යාපාරයක් සුවිශේෂ වූ අනන්‍යතාවය පිළිබඳ තොරතුරුයි. ව්‍යාපාරයට අදාළ හඳුනා ගැනීමේ සංකේත ඇතුළත් කිරීමට උචිත ස්ථානය මෙය වන අතර එම ව්‍යාපාරයේ ලිපි යොමුව, දුරකථන අංක, ෆැක්ස් අංක හා ඊමේල් ලිපිනය, වෙබ් අඩවිය යනාදිය තොරතුරු ඇතුළත් කරයි. සැලැස්ම පිළිබඳ කිසියම් ප්‍රශ්නයක් හෝ තොරතුරක් සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කළ යුතු පුද්ගලයාගේ නම ද මෙහි ඇතුළත්ය. (ලකුණු 4)